# ගම්පහ වික්‍රමාරච්චි
# දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

## උපකුලපති තනතුර සඳහා අයදුම්පත්/ නාම යෝජනා කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34(1) වන වගන්තියේ සහ එහි පසුකාලීන සංශෝධනවල නියමයන් ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා පුද්ගලයින්ගෙන් අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 මැයි 04 දිනැතිව නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේක අංක 02/2020 පරිශීලනය කිරීම සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසීමට (https://gwu.ac.lk) අපේක්ෂිත අයදුම්කරුවන්ට/ නාමකරුවන්ට ආරාධනා කෙරේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙක් වේ. ඔහු/ ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, අධ්‍යයන ප්‍රධානියා සහ ගණන්දීමේ නිලධාරියා ද වේ. ඔහු/ ඇය නිල බලයෙන් පාලක සභාවේ සහ සනාථන සභාවේ සාමාජිකයෙක් හා සභාපති ද වේ. අපේක්ෂිත

උක්ත අංක දරන විශ්වවිද්‍යාල පනතේ හා එහි සංශෝධනවල ප්‍රතිපාදන අනුව උපකුලපතිවරයා එම ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කලින් ධූරය අතහැර ගියහොත් හැර වසර තුනක කාලයක් සඳහා එම තනතුර දරනු ලබන අතර, ඔහු/ ඇය වයස අවුරුදු හැට පහක් සම්පූර්ණ වන තුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම, මෙහෙයවීම හා හඳුන්වාදීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපතිවරයා වගකිව යුතු අතර, ඔහු/ ඇය ඒ සඳහා සැමවිටම අධ්‍යයන විශිෂ්ටත්වය, පාර දෘශ්‍යභාවය, වගවීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල නායකත්ව මූලධර්ම පිළිපැදිය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඉහළ අධ්‍යයන ඉලක්ක සපුරාගත් සහ සාර්ථක පර්යේෂණ දර්ශකයන් සහිත, නායකත්ව ලක්ෂණයන්ගෙන් හෙබි විවිධ පුද්ගල පාර්ශවයන් සමග ප්‍රශස්ත අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගතහැකි, ගැටළු විශ්ලේෂණයට සහ හඳුනාගත් ගැටළු විසඳීමට මෙන්ම ඵලදායී විසඳුම් හඳුනාගැනීමට සහ සංකල්පීය කුසලතා සහිත, අනුමත තීරණ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඒ හා සම්බන්ධ සැලසුම් සහ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ඵලදායී සහ කාර්යක්ෂමව ඉටු කිරීමට දැඩි කැපවීමක් සහිත අයෙක් විය යුතුය. ඔහු/ ඇය විශ්වවිද්‍යාලයක්, සමාජය කෙරෙහි දක්වන දායකත්වය ඇතුළුව විශ්වවිද්‍යාලයක ආචාර ධර්ම සහ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයකින්ද හෙබි විය යුතුය. (අපේක්ෂිත අයදුම්කරුවන්/ නාමිකයන් වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා, https://gwu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න)

උපකුලපති, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, අදාළ මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් ඇතුළු තනතුරට අදාළ වෙනත් දීමනා සඳහා සුදුසුකම් ලබයි.

**අයදුම්පත්‍රය/ නාමයෝජනා පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ.**

01. උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ/ නාමිකයාගේ (අදාළ ලේඛන ඇතුළත්ව) සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (අයදුම්කරු/ නාමිකයා ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 මැයි 04 දිනැතිව නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි දක්වා ඇති ඇගයීම් නිර්ණායක හත සහ අදාළ මූලිකාංගවලට අනුකූලව අපේක්ෂකයාගේ පුද්ගලික, වෘත්තීය ගුණාංග, නිපුණතා, අත්දැකීම් සහ ජයග්‍රහණ දක්වමින් සාක්ෂි මගින් තහවුරු කරන ලද සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

02. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ "දැක්ම" පිළිබඳ තම පුද්ගලික ප්‍රකාශනයක් හා අයදුම්කරු/ නාමිකයා, උපකුලපති තනතුරට තෝරා ගතහොත් ඔහු/ ඇය විසින් එම විශ්වවිද්‍යාලයේ සංවර්ධනය උදෙසා ඉටුකිරීමට බලාපොරොත්තු වන මෙහෙවර පිළිබඳ ප්‍රකාශයක්.

03. අයදුම්කරු දැනට උපකුලපති ධූරය හොබවන්නේ නම් හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ එම ධූරය හොබවා ඇත්නම්, එම නිල කාලය තුළ ඔහු/ ඇය විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් විදහාපාන වාර්තාවක්.

04. නාමයෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්.

05. අයදුම්කරු/ නාමිකයා රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේනම්, ඔහු/ ඇය උපකුලපති තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් ඔහු/ ඇය නිදහස් කළ හැකි බවට සේවායෝජක කැමැත්ත ප්‍රකාශ කරන ලද්දා වූ ලිපියක්.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 මැයි 04 දිනැතිව නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි ඇමුණුම් 01 හි දක්වන ලකුණු පටිපාටියේ නිර්ණායකයන්ට අනුකූලව, ඇගයීම් කමිටුව විසින් එක් එක් අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමාලෝචනයට සහ තක්සේරු කිරීමට භාජනය කරනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් තෝරාගත්, විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කළ, අපේක්ෂක ලැයිස්තුවේ අපේක්ෂකයන් විශේෂ පාලක සභා රැස්වීමක් ඉදිරියේ විනාඩි 10 කට නොඅඩු විනාඩි 15 කට නොවැඩි සංෂිප්ත ඉදිරිපත් කිරීමක් සඳහා කැඳවනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020 මැයි 04 දිනැතිව නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි නියම කර ඇති පිළිගත් ක්‍රියා පටිපාටියට අනුව, පත්වීම් සලකා බැලීම සඳහා අපේක්ෂකයින්ගේ නම් තුනක් නිර්දේශ කර ලද විශේෂ සභා රැස්වීමේ වාර්තාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ.

අයදුම්පත් හෝ නාමයෝජනා 2022 පෙබරවාරි මස 25 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර "ලේඛකාධිකාරී/ පාලක සභාවේ ලේකම්, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ බාරදීම සිදු කළ යුතුය.

අයදුම්පත්/ නාමයෝජනා බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** යන්න සඳහන් කළ යුතුවේ. අවසාන දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත්/ නාම යෝජනා භාරගනු නොලැබේ.

- මෙම දැන්වීම සම්බන්ධ අර්ථ නිරූපණ ද්වේෂ පැනනගින්නේ නම් මෙහි ඉංග්‍රීසි පිටපත් වලංගු වේ.

**ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**ශ්‍රී ලංකාව.**

**2022-01-20**